අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015

ආර්ථික විද්‍යාව - I පත්‍රය

පිළිතුරු සඳහා මග පෙන්වීම

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
(1)	3	(26)	3
(2)	2	(27)	3
(3)	4	(28)	3
(4)	2	(29)	1
(5)	5	(30)	3
(6)	5	(31)	3
(7)	4	(32)	5
(8)	2	(33)	5
(9)	4	(34)	3
(10)	5	(35)	4
(11)	1	(36)	5
(12)	4	(37)	4
(13)	5	(38)	5
(14)	5	(39)	2
(15)	1	(40)	4
(16)	2	(41)	1
(17)	1	(42)	2
(18)	2	(43)	1
(19)	3	(44)	3
(20)	5	(45)	4
(21)	3	(46)	2
(22)	2	(47)	1
(23)	4	(48)	3
(24)	2	(49)	1
(25)	2	(50)	2

The National e-learning Portal for The General Education

[2 වන පිටුව බලන්න

1. (i) සැපයුම සීමා සහිත සම්පත් හෙවත් හිඟකමක් සහිත සම්පත් ආර්ථික සම්පත් ලෙස හඳුන්වයි. ආර්ථික සම්පත් හිඟ වන බැවින් ඒවායෙහි ආවස්ථික පිරිවැයක් පවතී. (ලකුණු 01)

උදා : වගා කළ හැකි ඉඩම්, ශ්‍රමිකයන්, යන්ත්‍ර, උපකරණ, ව්‍යවසායකත්ව හැකියාව (ලකුණු 01)

ශූන්‍ය මිලකදී පවා අසීමිත සැපයුමක් සහිත ද ආර්ථික නොවන සම්පත් ලෙස හැඳින්වේ. ආර්ථික නොවන සම්පත් භාවිතයේ ආවස්ථික පිරිවැය ශූන්‍ය වේ. (ලකුණු 01)

උදා : රෙදි වේලීමට භාවිත කරන හිරු එළිය
නිරිත දිග මෝසම් වර්ෂාව (ලකුණු 01)

(ii)

ආර්ථික පද්ධතියේ ස්වභාවය	සම්පත් අයිතියේ ස්වභාවය
1. ධනවාදී ආර්ථික පද්ධතිය	පෞද්ගලික අංශය, දේපළ හිමි කරගෙන සිටී.
2. සමාජවාදී ආර්ථික පද්ධතිය	රාජ්‍ය අංශය, දේපළ හිමි කරගෙන සිටී.
3. මිශ්‍ර ආර්ථික පද්ධතිය	රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය යන දෙඅංශය ම සම්පත් හිමි කරගෙන සිටියි.
4. සම්ප්‍රදායික ආර්ථික පද්ධතිය	සමාජයේ පුද්ගලයන් විසින් පොදු හිමිකමක් යටතේ සම්පත් භාවිත කරයි.

(iii) වෙළෙඳපොළ ආර්ථිකයක මිල යාන්ත්‍රණය ප්‍රධාන කාර්ය භාරයන් 03ක් ඉටු කරයි.

1. සංඥා සැපයීම
2. සානුබල සැපයීම
3. සලාක කිරීම

විකල්ප භාවිතයන් අතර සම්පත් බෙදා හැරීමෙහිලා මිල යාන්ත්‍රණයේ කාර්යභාරය ලෙස අදහස් කරන්නේ මිල පදනම් කරගනිමින් කුමක් කොපමණ නිපදවනවාද? යන ගැටලුව විසඳීමයි.

කුමක් කොපමණ නිපදවනවාද? යන ගැටලුව මිල මගින් විසඳනු ලබන්නේ සාපේක්ෂව වඩා ලාභදායී භාණ්ඩ නිපදවීමට සම්පත් වෙන් කිරීම මඟිනි. (ලකුණු 04)

(iv) කිසියම් ආර්ථිකයක සම්පත් ඌන උපයෝජනයක් පවතී නම් එම සම්පත් ආවස්ථික පිරිවැයකින් තොරව නිෂ්පාදන ක්‍රියාවලියට උපයෝජනය කළ හැකිය.



The National e-learning Portal for The General Education

[3 වන පිටුව බලන්න

D ලක්ෂ්‍යයේදී සම්පත්වල ඌන උපයෝජනයක් පවතී. එබැවින් ආවස්ථික පිරිවැයකින් තොරව ආහාර නිෂ්පාදනය පමණක් වැඩි කරමින් A ලක්ෂ්‍යය දක්වා ද ඇඳුම් නිෂ්පාදනය පමණක් වැඩි කරමින් C ලක්ෂ්‍යය දක්වා ද ආහාර හා ඇඳුම් යන දෙවර්ගයේම නිෂ්පාදනය වැඩි කරමින් B ලක්ෂ්‍යය දක්වා ද ගමන් කළ හැකිය. **(ලකුණු 02)**

කිසියම් ආර්ථිකයක් නිෂ්පාදන කාර්යක්ෂමතාවයේ පසුවේ නම්, එනම් නිෂ්පාදන හැකියා මායිම මත දැක්වෙන භාණ්ඩ සංයෝගයක් නිපදවයි නම් ආවස්ථික පිරිවැයකින් තොරව සම්පත් උපයෝජනය වෙනස් කළ නොහැක.



ආර්ථිකය A ලක්ෂ්‍යයේ නිෂ්පාදනයේ නිරත වී සිට ඇඳුම් නිෂ්පාදනය සඳහා සම්පත් උපයෝජනය වැඩි කළහොත් ආහාර නිෂ්පාදනය කැප කිරීමට සිදු වේ. B ලක්ෂ්‍යයේ නිෂ්පාදනයේ නිරත වී සිටී නම් ආහාර නිෂ්පාදනය සඳහා සම්පත් උපයෝජනය වැඩි කළහොත් ඇඳුම් නිෂ්පාදනය කැප කළ යුතුවේ. මේ නිසා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත සිටින විට සම්පත් උපයෝජනය වෙනස් කළහොත් ආවස්ථික පිරිවැයක් හට ගනී. **(ලකුණු 02)**

(v) මෙම ප්‍රකාශය අසත්‍ය වේ. ආර්ථික කාර්යක්ෂමතාව ඉටු කර ගැනීමට නිෂ්පාදන කාර්යක්ෂමතාව හා සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව යන කොන්දේසි දෙකම ඉටු විය යුතුය.

නිෂ්පාදන කාර්යක්ෂමතාවය ඉටු වන විට දෙන ලද සම්පත් ප්‍රමාණයකින් ලැබෙන නිමැවුම උපරිම වීම හෝ යම් දෙන ලද නිමැවුමක් ලබා ගැනීමට අවශ්‍ය කරන සම්පත් ප්‍රමාණය අවම වීම හෝ සිදුවිය යුතුය.

නිෂ්පාදන කාර්යක්ෂමතාව අත්කර ගැනීම සඳහා ඉටු විය යුතු කොන්දේසි 02 කි.

1. පූර්ණ සේවා නියුක්තිය
2. පූර්ණ නිෂ්පාදනය

සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව යන්නෙන් අදහස් වන්නේ ජනතාව වඩාත් වරණයක් දක්වන භාණ්ඩ නිෂ්පාදනය සඳහා සම්පත් භාවිත කිරීමයි. එනම් සමාජ වරණය අනුව නිෂ්පාදනය තීරණය කිරීමයි.

සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව ඉටුවීම සඳහා භාණ්ඩ ඒකකයේ මිල එහි ආන්තික පිරිවැයට සමාන විය යුතුය. (P = MC) **(ලකුණු 04)**

2. (i)

- පෞද්ගලික ඉල්ලුම යනු, වෙළෙඳපොළේ සිටින එක් ගැනුම්කරුවෙකු විසින් සලකා බලන භාණ්ඩය සඳහා වූ විකල්ප මිල ගණන් යටතේ ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන ප්‍රමාණයන් ය.
- වෙළෙඳපොළ ඉල්ලුම යනු, සලකා බලන භාණ්ඩය සඳහා වූ වෙළෙඳපොළේ සිටින සියලු ම ගැණුම්කරුවන්ගේ පෞද්ගලික ඉල්ලුම් ප්‍රමාණවල එකතුව වේ. **(ලකුණු 02)**

The National e-learning Portal for The General Education

[4 වන පිටුව බලන්න

(ii) ඉල්ලුම් ප්‍රමාණය, එම භාණ්ඩයේ මිලෙහි සෘණ ශ්‍රිතයක් වන්නේ හේතු දෙකක් නිසා ය.

★ ආදේශන ප්‍රතිවිපාකය

★ ආදායම් ප්‍රතිවිපාකය (ලකුණු 02)

(iii)



රු. 0 දී $ped = \frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q} = \frac{20}{10} \times \frac{0}{40} = 0$

රු. 10 දී $ped = \frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q} = \frac{20}{10} \times \frac{10}{20} = 1$

රු. 20 දී $ped = \frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q} = \frac{20}{10} \times \frac{20}{0} = \alpha$

රූප සටහන් සඳහා (ලකුණු 02)

- ඉල්ලුම් වක්‍රය මත නම්‍ය ඉල්ලුම් ප්‍රදේශයේදී මිල පහළ යාම ව්‍යාපාරික අයභාරය ඉහළ යාමට හේතු වේ.
- ඉල්ලුම් වක්‍රය මත ඒකීය නම්‍ය ඉල්ලුම් ලක්ෂ්‍යයේදී ව්‍යාපාරික අයභාරය උපරිමයට ළඟා වේ.
- ඉල්ලුම් වක්‍රය මත අනම්‍ය ඉල්ලුම් ප්‍රදේශයේදී මිල පහළ යාම ව්‍යාපාරික අයභාරය පහළ යාමට හේතු වේ. (ලකුණු 02)

The National e-learning Portal for The General Education

(iv) භාණ්ඩ වර්ග කිහිපයක මිල සැපයුම් නම්‍යතාව 1ට අඩු වීමට හෝ 1ට වැඩි වීමට පිළිවන. එසේ වන්නේ පහත හේතු නිසා ය.

- අදාළ භාණ්ඩය සඳහා තොග රැස්කිරීමේ හැකියාව
- අදාළ භාණ්ඩයේ නිෂ්පාදන ක්‍රියාවලියට සාධක සංචලනය කිරීමේ හැකියාව
- අදාළ භාණ්ඩයේ මිල වෙනස් වීමෙන් පසු ගත වී ඇති කාලය
- අදාළ භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ ධාරිතාව උපයෝජනය කළ ප්‍රමාණය (ලකුණු 04)

(v) (අ)

$Qd = a - bP$

$b = \frac{\Delta Qd}{\Delta P} = \frac{20}{4} = 5$

$Qd = a - 5P$

$100 = a - 5(20)$

$100 = a - 100$

$200 = a$

$Qd = 200 - 5P$

(ලකුණු 01)

$Qs = a + bP$

$b = \frac{\Delta Qs}{\Delta P} = \frac{20}{4} = 5$

$Qs = a + 5P$

$60 = a + 5(20)$

$60 = a + 100$

$60 - 100 = a$

$-40 = a$

$Qs = -40 + 5P$

(ලකුණු 01)

(ආ)

$Qd = Qs$

$200 - 5P = -40 + 5P$

$200 + 40 = 5P + 5P$

$240 = 10P$

$24 = P$

(ලකුණු 01)

$Qd = 200 - 5P$

$Qd = 200 - 5(24)$

$Qd = 200 - 120$

$Qd = 80$ හෝ

$Qs = -40 + 5P$

$Qs = -40 + 5(24)$

$Qs = -40 + 120$

$Qs = 80$

(ලකුණු 01)

(ඇ) සහනාධාරයෙන් පසු සැපයුම් සමීකරණය

$Qs_1 = -40 + 5(P + 10)$ හෝ

$Qs_1 = -40 + 5P + 50$

$Qs_1 = 10 + 5P$

සහනාධාරයෙන් පසු මිල

$Qd = Qs_1$

$200 - 5P = 10 + 5P$

$190 = 10P$

$19 = P$

$Qd = Qs$

$200 - 5P_b = -40 + 5P_s$

$200 - 5P_b = -40 + 5(P_b + 10)$

$200 - 5P_b = -40 + 5P_b + 50$

$200 - 5P_b = 10 + 5P_b$

$190 = 10P_b$

$19 = P_b$

සහනාධාරයෙන් පසු සමතුලිත ප්‍රමාණය

$Qd = 200 - 5P$

$Qd = 200 - 5(19)$

$Qd = 200 - 95$

$Qd = 105$

(ලකුණු 02)

The National e-learning Portal for The General Education

සහනාධාරය සඳහා රජය දරන වියදම $= 10 \times 105 = 1050$

පාරිභෝගික පැහැදම වෙනස් වීම

සහනාධාරයට පෙර පාරිභෝගික පැහැදම $= 24 \times 80 = 1920$

සහනාධාරයට පසු පාරිභෝගික පැහැදම $= 19 \times 105 = 1995$

පාරිභෝගික පැහැදම (1995 - 1920) = රු. 75 කින් ඉහළ යයි. (ලකුණු 02)

3. (i) මුළු අයභාරය – (ඍජු පිරිවැය) = ගිණුම්කරණ ලාභ (ලකුණු 02)

මුළු අයභාරය – මුළු ආවස්ථික පිරිවැය (ඍජු පිරිවැය + වක්‍ර පිරිවැය) = ආර්ථික ලාභ (ලකුණු 02)

ප්‍රාමාණික ලාභ, ව්‍යවසායකයා තම ව්‍යවසාය කාර්යය වෙනුවෙන් අපේක්ෂා කරන අවම ඉපැයුම වේ. (ලකුණු 02)

- ගිණුම්කරණ ලාභයේදී ආරෝපිත පිරිවැය සැලකිල්ලට ගන්නේ නැත.
- ආර්ථික ලාභයේදී ආරෝපිත පිරිවැය සැලකිල්ලට ගන්නා නිසා ගිණුම්කරණ ලාභයට වඩා ආර්ථික ලාභ අඩු වේ.
- ප්‍රාමාණික ලාභ ආරෝපිත පිරිවැයට ඇතුළත් වේ. TR > TC විට ආර්ථික ලාභ ලැබේ.

[6 වන පිටුව බලන්න

(ii) කෙටි කාලයේදී ස්ථාවර යෙදවුම් නොවෙනස්ව තබාගෙන විචල්‍ය යෙදවුම් පමණක් වෙනස් කරමින් නිෂ්පාදනයේ යෙදෙන විට එක්තරා අවස්ථාවකට පසු විචල්‍ය යෙදවුමේ සාමාන්‍ය හා ආන්තික නිෂ්පාදිතය පහළ වැටෙන බව හීනවන එලදා නීතියෙන් පැහැදිලි කරයි. කෙටි කාලයේදී නිෂ්පාදන ක්‍රියාවලියේ ආන්තික එලදාව හීනවන විට ආන්තික පිරිවැය ඉහළ නඟී. පරිමාණානුකූල එල නීතිය විග්‍රහ කරන්නේ දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක් සම්බන්ධයෙන් ය. මෙහිදී සියලු යෙදවුම් නිශ්චිත ප්‍රතිශතයකින් වැඩි කරන විට ඊට වඩා අඩු ප්‍රතිශතයකින් නිමැවුම වර්ධනය වන තත්ත්වය අඩුවන පරිමාණානුකූල එල මගින් දැක්වේ. මේ නිසා දිගුකාලීන සාමාන්‍ය පිරිවැය ඉහළ යයි.

පරිමාණානුකූල එල නීතිය මගින් විග්‍රහ කරන්නේ දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක් සම්බන්ධයෙන් සියලු ම යෙදවුම් (පරිමාව) වෙනස් කරන විට නිමැවුම හැසිරෙන ආකාරයයි. අඩුවන පරිමාණානුකූල එල නීතිය මගින් විග්‍රහ කරන්නේ සියලුම යෙදවුම් වැඩි කරන ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් නිමැවුම ඉහළ යන බවයි. අඩුවන පරිමාණානුකූල එල පවතින විට දිගුකාලීන සාමාන්‍ය පිරිවැය ඉහළ නඟී. (ලකුණු 04)

(iii) දිගු කාලයේදී නිෂ්පාදන ආයතනයක් නිෂ්පාදනය ප්‍රසාරණය කිරීමේදී ආයතනයේ ඒකක පිරිවැය පහළ බැසීම නිසා ඇතිවන වාසිදායක තත්වයක් පරිමාණානුකූල පිරිමැසුම් නම් වේ. පරිමාණානුකූල පිරිමැසුම් හට ගන්නේ,

(අ) තාක්ෂණික පිරිමැසුම්

(ආ) අලෙවිකරණ පිරිමැසුම්

(ඇ) කළමනාකරණ පිරිමැසුම්

(ඈ) මූල්‍ය පිරිමැසුම්

(ඉ) අවදානම් දැරීම හා සම්බන්ධ පිරිමැසුම් නිසා ය. (ලකුණු 04)

(iv) • සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) අවම වන අවස්ථාවේදී පවතින මිල, අවම සැපයුම් මිල වේ. රූප සටහනේ P_1 උදාහරණය වේ.



(ලකුණු 04)

(v) • ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් අති විශාල සංඛ්‍යාවක් සිටීම
• අබාධ පිවිසුම හා පිටවුම
• සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය (ලකුණු 02)

The National e-learning Portal for the General Education

[7 වන පිටුව බලන්න

4. (i) (අ) දළ දේශීය නිෂ්පාදිතය (වෙ.මි.) = දේශීය ඉතුරුම් + මුළු පරිභෝජනය

= S_D + $(C + G)$

= 400 + 800

= රු.මි. 1200 **(ලකුණු 02)**

(ආ) ශුද්ධ දේශීය ආදායම = බදු කුලිය + වැටුප් + පොළිය + සමාගමික ලාභ

= 250 + 400 + 150 + 150

= රු.මි. 950 **(ලකුණු 02)**

(ඇ) ප්‍රාග්ධන ක්ෂයවීම් = දළ දේශීය නිෂ්පාදනය – ශුද්ධ දළ දේශීය නිෂ්පාදනය

= 1200 – (950 + 150)

= රු.මි. 100 **(ලකුණු 02)**

(ii)
- අනිවාර්යයෙන් සමාන නොවේ.
- එහෙත් සමාන විය හැකි තත්වයන් ද පවතී.
  - (අ) විදේශ වෙළෙඳාමක් නොමැති රටක් වීම.
  - (ආ) අපනයන ලැබීම් හා ආනයන ගෙවීම් සමාන වීම.
- අපනයන හා ආනයන වටිනාකම් අසමාන වන විට දළ දේශීය වියදම හා දළ දේශීය නිෂ්පාදනය අතර වෙනසක් හට ගනී. $X > M$ විට දළ දේශීය වියදම < දළ දේශීය නිෂ්පාදනය වේ. $X < M$ විට දළ දේශීය වියදම > දළ දේශීය නිෂ්පාදනය වේ. **(ලකුණු 04)**

(iii) දත්ත ලබා ගැනීමට නොහැකි වීම හෝ වටිනාකම් පැහැදිලිව ගණනය කළ නොහැකි විට ඇතැම් ඵලදායි ගනුදෙනු ජාතික ගිණුම් තුළින් මග හැරේ. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල එය ප්‍රධාන තැනක් ගනී. එවැනි අයිතම වනුයේ,

- ★ ගෘහණියන්ගේ කටයුතු
- ★ යැපුම් ආර්ථික කටයුතු
- ★ නොවිධිමත් ආර්ථික කටයුතු
- ★ සැඟවුණු ආර්ථික කටයුතු
- ★ වාර්තා නොවන ඵලදායි ආර්ථික කටයුතු **(ලකුණු 04)**

(iv)
- ආර්ථික වෘද්ධිය මැනීම
- ආර්ථික කාර්ය සාධනය මිනීම් කළ හැකිවීම
- ආර්ථික ව්‍යුහය හා එහි වෙනස්වීම් විමර්ශනය
- සම්පත් හා සම්පත් උපයෝජනය හඳුනා ගැනීම
- අන්තර් ජාතික සැසඳීම් සඳහා
- කාර්යාත්මකව ආදායම් ව්‍යාප්තිය විමර්ශනය
- ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය **(ලකුණු 04)**

(v)
- බදු කුලිය
- වැටුප්
- පොළිය
- සමාගමික ලාභ
- ක්ෂයවීම්
- ශුද්ධ වක්‍ර බදු (වෙළෙඳ මිල නම්) **(ලකුණු 02)**

The National e-learning Portal for The General Education

[8 වන පිටුව බලන්න

5. (i) සරල ආර්ථිකයක වැය කළ හැකි ආදායම ප්‍රධාන කරුණු දෙකක් සඳහා යොදා ගැනේ. එනම් පරිභෝජනය සහ ඉතුරුම් යන කරුණු සඳහා ය.
වැය කළහැකි ආදායමින් කොටසක් ඉතිරි කිරීම් සඳහා භාවිත කරන්නේ නම් ආන්තික පරිභෝජන නැමියාව 1ට වඩා අඩු අගයක් ගනී. **(ලකුණු 02)**

(ii) 1) පෞද්ගලික පරිභෝජන වියදම් ඉහළ යාම
2) ආයෝජන වියදම් ඉහළ යාම
3) රාජ්‍ය වියදම් ඉහළ යාම
4) ශුද්ධ අපනයන ඉහළ යාම
5) ස්වාධීන බදු පහළ යාම
6) ස්වාධීන ආනයන පහළ යාම **(ලකුණු 04)**

(iii) (අ) $c = a + b\,\text{Yd}$

$$b = \frac{\Delta C}{\Delta Yd} = \frac{1500}{2000} = 0.75$$

$$C = a + 0.75\ Yd$$

$$1250 = a + 0.75 \times 1000$$

$$1250 = a + 750$$

$$500 = a$$

$$C = 500 + 0.75\ Yd$$ **(ලකුණු 02)**

(ආ) $Y = C + I + G$

$$Y = 500 + 0.75\ Yd + 300 + 100$$

$$Y = 900 + 0.75\ (Y - T)$$

$$Y = 900 + 0.75\ (Y - 100)$$

$$Y = 900 + 0.75Y - 75$$

$$Y = 825 + 0.75\ Y$$

$$0.25\ Y = 825$$

$$Y = 3300$$ **(ලකුණු 02)**

(ඉ)

$$W = J$$

$$S + T = I + G$$

$$300 + 100 = 300 + 100$$

$$400 = 400$$

සමතුලිත ආදායමේදී ඉතුරුම්

$$S = -500 + 0.25\ Yd$$

$$S = -500 + 0.25\ (Y - 100)$$

$$S = -500 + 0.25\ Y - 25$$

$$S = -525 + 0.25\ Y$$

$$S = -525 + 0.25\ (3300)$$

$$S = 300$$ **(ලකුණු 02)**

The National e-learning Portal for The General Education

[9 වන පිටුව බලන්න

(ඊ)



(ලකුණු 04)

(iv) ආර්ථිකයක, පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සමාහාර ඉල්ලුමක් නොපවතින විට ආර්ථිකය සේවා වියුක්ති තත්ත්වයක් යටතේ සමතුලිත විය හැකිය.



(රූප සටහනට ලකුණු 02)

පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම Y_2 වේ. එම මට්ටම පවත්වාගෙන යාම සඳහා E_2 සමාහාර ඉල්ලුමක් පැවතිය යුතුය. ආර්ථිකයේ සැබෑ සමාහාර ඉල්ලුම E_1 මට්ටමෙහි පවතී නම් ආර්ථිකය සමතුලිත වන්නේ Y_1 නිමැවුම් මට්ටමේදී ය. එබැවින් ආර්ථිකයෙහි $Y_2 - Y_1$ සේවා වියුක්තියක් පවතී.

(පැහැදිලි කිරීමට ලකුණු 02)

The National e-learning Portal for The General Education

6. (i)
- ගනුදෙනු චේතනාව
- ආරක්ෂණ චේතනාව
- සමපේක්ෂණ චේතනාව

(ලකුණු 03)

(ii) මුදල් සැපයුම = මුදල් පදනම × මුදල් ගුණකය

මුදල් පදනම තීරණය කරන සාධක
- මහ බැංකුව සතු ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය
- මහ බැංකුව රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය
- මහ බැංකුව වාණිජ බැංකුවලට සපයන ලද ණය ප්‍රමාණය
- මහ බැංකුවේ අනෙකුත් ශුද්ධ වත්කම් ප්‍රමාණය

මුදල් ගුණකය තීරණය කරන සාධක

- ★ බැංකු පද්ධතියේ අධි සංචිත ප්‍රමාණය
- ★ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය
- ★ මහජනයා සතු ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතු අතර අනුපාතිකය **(ලකුණු 04)**

(iii) (අ) අධි සංචිතය = සැබෑ සංචිතය – ව්‍යවස්ථාපිත සංචිතය

$$= 250 - (2000 \times \frac{10}{100})$$

$$= 250 - 200$$

$$= 50$$

අලුතින් ලබා දිය හැකි ණය ප්‍රමාණය රු.මි. 50 ක් පමණි. **(ලකුණු 02)**

(ආ)

වගකීම් (රු.මි.)		වත්කම් (රු.මි.)	
තැන්පතු	2050	තැන්පතු	250
		ණය	1800
	2050		2050

(ලකුණු 02)

(iv) **මහ බැංකුවේ අරමුණු** / **මහ බැංකුවේ කාර්යයන්**

- මිල හා ආර්ථික ස්ථායීතාව
  - ★ මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම
  - ★ විනිමය අනුපාත ප්‍රතිපත්තිය මෙහෙයවීම
  - ★ නිල විදේශ සංචිත කළමනාකරණය
  - ★ ව්‍යවහාර මුදල් නිකුතුව
- මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව
  - ★ මූල්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය
  - ★ අවසාන ණය දෙන්නා වශයෙන් කටයුතු කිරීම
  - ★ නිෂ්කාශණ පහසුකම් සැලසීම

(ලකුණු 04)

(v) (අ)
- උද්ධමනය යනු රටක සාමාන්‍ය මිල මට්ටම දීර්ඝ කාලයක් තුළ අඛණ්ඩව ඉහළ යාමේ ප්‍රවණතාවයයි.
- අවධමනය යනු රටක සාමාන්‍ය මිල මට්ටම අඛණ්ඩව පහළ යාමේ ප්‍රවණතාවයයි.

(ලකුණු 02)

(ආ)
- කොළඹ පාරිභෝගික මිල දර්ශකය
- තොග මිල දර්ශකය
- ගම්‍ය මිල දර්ශකය **(ලකුණු 03)**

The National e-learning Portal for The General Education

[11 වන පිටුව බලන්න

7. (i) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාත්මක කිරීමේදී පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටමෙන් පසු තවදුරටත් නිමැවුම ඉහළ නැංවිය නොහැකි නිසා මිල මට්ටම ඉහළ යාමක් විනා ආර්ථික වෘද්ධියක් අපේක්ෂා කළ නොහැක.

මෙවන් සීමාවකදී විකල්පයක් ලෙස සැපයුම් පාර්ශ්වීය ප්‍රතිපත්ති ස්වරූපයකින් රාජ්‍ය මූල්‍ය හැසිරවිය යුතුය.

උදා : පෞද්ගලීකරණය, නියාමනහරණය, ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය
ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය, අය බදු සංශෝධනයන් **(ලකුණු 04)**

(ii) බදු පදනම යනුවෙන් අදහස් කරන්නේ බද්දට විෂය වූයේ කවර කරුණු ද යන්නයි. එනම් බදු අය කරන්නේ කුමන කරුණක් පදනම් කරගෙන ද යන්නයි.

උදා: බද්දට පදනම වූයේ ආදායම නම්, බදු වර්ග කරන්නේ ආදායම් බදු ලෙස ය.
බද්දට පදනම් වූයේ විදේශ වෙළෙඳාම නම් අපනයන බදු හා ආනයන බදු ලෙසද,
බද්දට පදනම් වූයේ අලෙවිය නම් වරණ අලෙවි බදු ලෙසද බදු වර්ග කරනු ලබයි.

(ලකුණු 04)

(iii) රාජ්‍ය වියදම ප්‍රධාන නිර්ණායක දෙකක් යටතේ වර්ග කළ හැක.

- ★ ආර්ථික වර්ගීකරණය
- ★ කාර්යබද්ධ වර්ගීකරණය

ආර්ථික වර්ගීකරණය

- වර්තන වියදම
  - භාණ්ඩ හා සේවා
  - රාජ්‍ය ණය පොළී
  - වර්තන සංක්‍රාම
- ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම්
  - මූර්ත වත්කම් අත්පත් කරගැනීම්
  - ප්‍රාග්ධන සංක්‍රාම

කාර්ය බද්ධ වර්ගීකරණය

- වර්තන වියදම
  - සාමාන්‍ය හා පොදු සේවා
  - සමාජ සේවා
  - ආර්ථික සේවා
  - වෙනත් (පොළී ගෙවීම්)
- ප්‍රාග්ධන වියදම
  - සාමාන්‍ය පොදු සේවා
  - සමාජ සේවා
  - ආර්ථික සේවා

(ලකුණු 04)

(iv)(අ) සමස්ත ශේෂය = ප්‍රදාන ඇතුළත් රාජ්‍ය ආදායම – රජයේ මුළු වියදම
= 12 000 – 15 000
= – 3 000 **(ලකුණු 02)**

(ආ) ශුද්ධ මූල්‍ය හිඟය = සමස්ත අය වැය හිඟය – ණය ආපසු ගෙවීම
= – 3 000 – 1 000
= – 2 000 **(ලකුණු 02)**

The National e-learning Portal for The General Education

[12 වන පිටුව බලන්න

(v) රාජ්‍ය ණය වෙනස්වීම

	රුපියල් බිලියන	රාජ්‍ය ණය ද.දේ.නි %ලෙස
2011	5133	78.5
2012	6000	79.2
2013	6793	78.3

(ලකුණු 02)

- නිරපේක්ෂ වශයෙන් රාජ්‍ය ණය ප්‍රමාණය ඉහළ ගොස් ඇත.

රාජ්‍ය ණය ඉහළ යාමේ ප්‍රතිවිපාක

- රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් ඉහළ යාම.
- රාජ්‍ය අයවැය ලේඛනයේ වර්තන ගිණුමේ හිඟයක් ඇති වීමට හේතු වීම.
- ණය ලැබෙන විට රටට විදේශ වත්කම් ගලා ඒම නිසා මුදලේ විදේශ අගය ශක්තිමත් වීම.
- දිගු කාලීන වශයෙන් ණය ගෙවන විට ගෙවුම් ශේෂ දුෂ්කරතා ඇති වීම.
- බැංකු ණය ගැනීම් මුදල් සැපයුම ප්‍රසාරණයට හේතු වේ.
- දේශීය වෙළෙඳපොළ මාර්ග වලින් රාජ්‍ය ණය ගන්නා විට තෙරපුම් ප්‍රතිවිපාකයක් ඇති වේ.
- පොළී අනුපාතික ඉහළ යාමට හේතු වේ. (ලකුණු 02)

The National e-learning Portal for The General Education

8. (i) (අ) භාණ්ඩ දෙවර්ගය සඳහාම නිරපේක්ෂ වාසි පවතින්නේ ඕස්ට්‍රේලියාවට ය.

(ලකුණු 02)

(ආ) කිරිපිටි - ඕස්ට්‍රේලියාව
මාළු ටින් - නවසීලන්තය (ලකුණු 02)

(ඇ)

නවසීලන්තය	ඕස්ට්‍රේලියාව
කිරි පිටි පැකට් 1 = මාළු ටින් 2	කිරි පිටි පැකට් 1 = මාළු ටින් 0.5
මාළු ටින් 1 = කිරි පිටි පැකට් 0.5	මාළු ටින් 1 = කිරි පිටි පැකට් 2

(ලකුණු 02)

(ඈ)
- නවසීලන්තය මාළු ටින් 1 ක් අපනයනය කර කිරිපිටි පැකට් 0.5 ත් 2ත් අතර ප්‍රමාණයක් ආනයනය කළ යුතුය.
- ඕස්ට්‍රේලියාව කිරිපිටි පැකට් 1 ක් අපනයනය කර මාළු ටින් 0.5 ත් 2ත් අතර ප්‍රමාණයක් ආනයනය කළ යුතුය. (ලකුණු 02)

(ii) නාමික ආරක්ෂණ අනුපාතය යනු දේශීය නිෂ්පාදිතයට තරගකාරීව ආනයනය කරන භාණ්ඩයක් මත තීරු බදු පැනවීම නිසා ආනයන භාණ්ඩයෙහි මිල ඉහළ යාම කරන කොටගෙන දේශීය නිෂ්පාදිතයන්ට ලැබෙන ආරක්ෂණය මිනුම් කොට දැක්වීමයි.

$$\text{නාමික ආරක්ෂණ අනුපාතය} = \frac{\text{තීරු බදු පැනවීමෙන් පසු දේශීය භාණ්ඩයේ මිල}}{\text{තීරු බදු පැනවීමෙන් පසු ආනයන භාණ්ඩයේ මිල}} \times 100$$

සඵල ආරක්ෂණ අනුපාතය යනු තීරු බදු පැනවීමෙන් පසු දේශීය නිෂ්පාදනයේ එකතු කළ අගයත් (V_1) තීරු බදු පැනවීමට පෙර දේශීය නිෂ්පාදිතයේ එකතු කළ අගයත් (V_0) අතර වෙනස, තීරුබදු පැනවීමට පෙර දේශීය නිෂ්පාදිතයේ එකතු කළ අගයේ (V_0) ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.

$$\text{සඵල ආරක්ෂණ අනුපාතය} = \left(\frac{V_1 - V_0}{V_0}\right) \times 100$$

(ලකුණු 04)

[13 වන පිටුව බලන්න

(iii) (අ) මූල්‍ය ගිණුම හර (මිලියන)	150		
වෙළෙඳ භාණ්ඩ ගිණුම බැර (මිලියන)		150	
(ආ) සේවා ගිණුම හර (මිලියන)	20		
මූල්‍ය ගිණුම බැර (මිලියන)		20	
(ඉ) මූල්‍ය ගිණුම හර (මිලියන)	50		
ප්‍රාථමික ආදායම් ගිණුම බැර (මිලියන)		50	
(ඊ) මූල්‍ය ගිණුම හර (මිලියන)	30		
ද්විතියික ආදායම් ගිණුම බැර (මිලියන)		30	
(උ) සෘජු ආයෝජන (මූල්‍ය ගිණුම) හර (මිලියන)	500		
මූල්‍ය ගිණුම බැර (මිලියන)		500	(ලකුණු 05)

(iv) ස්ථාවර විනිමය අනුපාතය යනු විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක් සඳහා හුවමාරු වන දේශීය මුදල් ඒකක ප්‍රමාණය මූල්‍ය අධිකාරිය විසින් තීරණය කරනු ලැබීමෙන් පසු එකම මට්ටමක පවත්වා ගෙන යාමය. පැරණි රන් මිනුම් ක්‍රමය පූර්ණ ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයකි.

නම්‍ය විනිමය අනුපාතය යනු විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක් සඳහා පවතින ඉල්ලුම හා සැපයුම මත නිරන්තරයෙන් වෙනස් වීමට භාජනය වන විනිමය අනුපාතිකයයි. (ලකුණු 03)

The National e-learning Portal for the General Education

9. (i) **සම්පත් සම්භාරය**

- නව සම්පත් සොයා ගැනීම
- විදේශ ආයෝජන ගලා ඒම
- ප්‍රාග්ධන සම්පාදනය
- විදේශ පුහුණු ශ්‍රමය මෙරටට සංක්‍රමණය වීම

සම්පත්වල ඵලදායීතාවය වෙනස්වීම

- තාක්ෂණය දියුණු වීම
- කළමනාකරණය සංවර්ධනය වීම
- නිපුණතා සංවර්ධනය වීම
- ශ්‍රම විභජනය

සාර්ව ආර්ථික ස්ථායීතාවය

දේශපාලන ස්ථාවරත්වය

යහ පාලනය

ව්‍යවසායකයින් වර්ධනය (ලකුණු 02)

(ii) • **සංවර්ධනය**

කිසියම් රටක ජනතාවගේ ජීවන තත්වය උසස් වීමේ ක්‍රියාවලිය සංවර්ධනය ලෙස සැළකේ. එය බහුමාන ක්‍රියාවලියකි. එනම් ආර්ථික, සමාජයීය, සංස්කෘතික, දේශපාලනික යන සැම පැතිකඩක් ඔස්සේම ජනතාවගේ ජීවන තත්වය යහපත් දිශාවකට වෙනස් වීමේ ක්‍රියාවලියයි.

- **මානව සංවර්ධනය**

  පුද්ගලයින්ගේ කාර්යයන් හා හැකියාවන් ප්‍රසාරණය වන පරිදි තෝරා ගැනීමේ ඉඩ ප්‍රස්තා පුළුල් වීමේ ක්‍රියාවලියයි. නොඑසේ නම් සමාජයේ සෑම කෙනෙකුටම සතුටුදායක ලෙස දිගු කාලයක් ජීවත් වීමට අවශ්‍ය භෞතික දෑ සහ මානව අවශ්‍යතා සපුරා ගැනීමට තිබෙන ඉඩ ප්‍රස්තා පුළුල් වීමයි.

  ආමාර්ත්‍ය සෙන් පවසන පරිදි පුද්ගලයන්ගේ හිමිකම් (Entitlements) සහ සමර්තතාවයන් (Capabilities) ප්‍රසාරණය වීමේ ක්‍රියාවලිය මානව සංවර්ධනය යි.

- **තිරසාර සංවර්ධනය**

  අනාගත පරම්පරාවල අවශ්‍යතා සපුරා ගැනීමේ හැකියාවට හානියක් නොවන පරිදි වර්තමාන සමාජයේ අවශ්‍යතා සපුරා ගැනීම තිරසාර සංවර්ධනයයි. මෙහි පැතිකඩවල් තුනක් ඇත.
  - ආර්ථික සංවර්ධනය
  - සමාජයීය සංවර්ධනය
  - පරිසර සුරක්ෂිතතාව

(ලකුණු 06)

(iii) **දළ උපත් අනුපාතිකය පහළ යාම**
- දරු සඵලතාව පහළ යාම
- පවුල් සැලසුම් හා උපත් පාලනය
- ස්ත්‍රී සේවා නියුක්තිය ඉහළ යාම
- විවාහ වන වයස් සීමාව ඉහළ යාම

ශුද්ධ සංක්‍රමණ සෘණ අගයක් ගැනීම
- අධ්‍යාපනය සඳහා විදේශ ගත වීම
- රැකියා අවස්ථා සඳහා විදේශ ගත වීම
- ඥාති සම්බන්ධතා මත විදේශගත වීම

ආර්ථික බලපෑම
- ජනගහනය වයස්ගත වීම
- ළමා ජනගහනය පහළ යාම
- යැපුම් අනුපාතිකය පහළ යාම
- ප්‍රජා විද්‍යාත්මක පාරිතෝෂිකයක් හිමි වීම
- රජයේ ශුභසාධන වියදම් පහළ යාම

(ලකුණු 04)

(iv) ආදායම් දරිද්‍රතාවයේ පැතිකඩ දෙකක් ඇත.

නිරපේක්ෂ දරිද්‍රතාවය

පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමක මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොලැබීම නිරපේක්ෂ දරිද්‍රතාවය වේ. ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීමේදී වැදගත් වන්නේ නිරපේක්ෂ දරිද්‍රතාවයයි. එය මිනුම් කරන්නේ

1) දිළිඳු පවුල් ප්‍රතිශතය
2) ජනගහන දරිද්‍රතා දර්ශකය ආදී මිනුම් මඟිනි.

සාපේක්ෂ දරිද්‍රතාවය

සමාජයේ යම් ජන පිරිසකට සාපේක්ෂව තවත් ජන පිරිසකගේ ආර්ථික හා සමාජයීය අවශ්‍යතා ඉටු කර ගැනීමේ හැකියාව පහළ මට්ටමක පැවතීම සාපේක්ෂ දරිද්‍රතාවයයි. එය මිනුම් කරන්නේ අදාළ රටේ මධ්‍යන්‍ය ආදායමෙන් 50%ට වඩා අඩු ආදායම් ලබන ජනගහනය එරටේ මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම හෝ රටේ පහළ ආදායම් ලබන පවුල් 40%, ලබන ආදායම් සීමාවෙන් පහළ සිටින ජනගහනය එරටේ මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම මගිනි.

(ලකුණු 04)

[15 වන පිටුව බලන්න

The National e-learning Portal for The General Education

(v) ජාතික දරිද්‍රතා ආපාතය අඩු වී ඇත.

- 1990 26.1
- 1995/ 1996 28.8
- 2002 22.7
- 2006 / 2007 15.2
- 2009 / 2010 8.9
- 2012 6.7

- දිවයිනේ සමස්ත දරිද්‍රතා ආපාතය අඩුවී ඇත.
- නමුත් එහි ප්‍රාදේශීය විෂමතා පවතී.

අංශ අනුව

	1995/ 1996	2012
නාගරික	14	2.4
ග්‍රාමීය	30.9	7.5
වතු	38.4	6.2

- ග්‍රාමීය හා වතු අංශවල දරිද්‍රතාව තවමත් කැපී පෙනෙන මට්ටමක පවතී. **(ලකුණු 04)**

10. (i) **සමාජ ආර්ථික බලපෑම්**

ජනගහනය වියපත් වීම ආර්ථිකයේ හා සමාජයේ විවිධ අංශ කෙරේ බලපෑම් සිදු කරයි. එසේ බලපෑම් සිදු කරන ප්‍රධාන පාර්ශව ලෙස ශ්‍රම සැපයුම, ප්‍රාග්ධන වෙළෙඳපොළ, නිෂ්පාදනය, ඉතුරුම් සහ ආයෝජනය, රාජ්‍ය මූල්‍ය, රාජ්‍ය ණය, ආදායම්, සේවා නියුක්තිය සහ සෞඛ්‍යය යන අංශ වෙත අයහපත් බලපෑම් ඇති කරයි.

විසඳුම් සහ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග :

- ⋆ වැඩ කරන අවුරුදු ගණන වැඩි කිරීම සහ විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ දියත් කිරීම
- ⋆ සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු කිරීම
- ⋆ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ
- ⋆ ශ්‍රම වෙළෙඳපොළේ ප්‍රතිසංස්කරණ
- ⋆ ශ්‍රම කාර්යක්ෂමතාව වර්ධනය කිරීමේ තාක්ෂණය හඳුන්වා දීම **(ලකුණු 05)**

(ii) **අවස්ථා :**

- ⋆ කෘෂි අංශය තුළ විභව හැකියාවන් පැවතීම (Agriculture)
- ⋆ මත්ස්‍ය වගාව ආශ්‍රිත විභව හැකියාවන් පැවතීම (Aquaculture)
- ⋆ පශු සම්පත් ක්ෂේත්‍රය තුළ විභව හැකියාවන් පැවතීම (Animal Husbandry)
- ⋆ නාවික ගුවන් වැනි ක්ෂේත්‍රයන් තුළ ආයෝජන අවස්ථා පැවතීම (5 Hubs)

බාධක :

- ⋆ යටිතල පහසුකම් හා සම්බන්ධ දුර්වලතා
- ⋆ විදුලි බලය සැපයීමේ දුර්වලතා පැවතීම
- ⋆ මූල්‍ය පහසුකම් සඳහා ඇති සීමිත ඉඩකඩ හා අධික පිරිවැය වියදම්
- ⋆ සාර්ව ආර්ථික අස්ථායීතාව
- ⋆ ශ්‍රමය යොදා ගැනීම පිළිබඳ රෙගුලාසි (ශ්‍රම වෙළෙඳපොළ දෘඩතාවයන්)
- ⋆ ඉහළ බදු බර
- ⋆ යහ පාලනය බිඳ වැටීම
- ⋆ ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රවාහන ගැටලු **(ලකුණු 05)**

[16 වන පිටුව බලන්න

The National e-learning Portal for The General Education

(iii) දරිද්‍රතාවය 6.7 දක්වා අඩු වී ඇත. පසුගිය දස වසර තුළ ක්‍රියාත්මක කළ වෘද්ධි ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවේ සමස්ත දරිද්‍රතාව පහළ දැමීමට ඉවහල් වී ඇත. ඒ සඳහා ඉවහල් වූ ප්‍රතිපත්ති පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කළ හැක.

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති

- උද්ධමනය පාලනය කිරීම
- තෝරා ගනු ලබන පදනමක් මත විවෘත ආර්ථිකයට ඉඩදීම

ආංශික ප්‍රතිපත්ති

- දිළින්දන්ට වඩාත් යෝග්‍ය ආර්ථික ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීම
  උදා : (කෘෂිකර්මය, මානව ප්‍රාග්ධන සංවර්ධනය, කාන්තාවන් සවිබල ගැන්වීම)

ප්‍රාදේශීය ප්‍රතිපත්ති

- ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීම
- ආදායම් පුනර්ව්‍යාප්තිය
- ඉඩම් බෙදා දීම
- ණය පහසුකම් සැලසීම
- සංක්‍රාම ආදායම් ලබා දීම
- ග්‍රාමීය ප්‍රදේශවලට තොරතුරු තාක්ෂණික පහසුකම් සැපයීම (ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ ශ්‍රමය විදේශ රටවලට සංක්‍රමණය සැලකිල්ලට ගත්විට පහත සඳහන් ප්‍රවණතා ඇත.

- කාන්තාවන්ගේ සංක්‍රමණය ඉහළ ප්‍රතිශතයක් ගැනීම
- සංක්‍රමණය වන දිශාව අනුව බලන විට බහුලව මැද පෙරදිග රටවලට සංක්‍රමණය වීම
- ගෘහ ආශ්‍රිත රැකියා සඳහා ශ්‍රමය සංක්‍රමණය වීම
- ශ්‍රමය සංක්‍රමණය වීම ශ්‍රී ලංකා ආර්ථිකයට යහපත් මෙන්ම අයහපත් ලෙසද බලපානු ලබයි.

යහපත් බලපෑම්

- විදේශ ඉපයුම් ඉහළ යාම
- ගෙවුම් ශේෂ ගැටලුවලට විසඳුම් ලැබීම
- විරැකියා ප්‍රශ්නයට විසඳුමක් වීම
- ආර්ථිකය තුළ දරිද්‍රතාවයට විසඳුමක් ලැබීම
- විදේශගතවූවන් මෙරටට පැමිණි පසු ආයෝජනයට පෙළඹීම
- නව තාක්ෂණය ශ්‍රී ලංකාවට රැගෙන ඒම

අයහපත් බලපෑම්

- කුටුම්බය තුළ අනාරක්ෂිත භාවය
- දෙමාපිය රැකවරණය දරුවනට අහිමි වීම
- විදේශ ගතවූවන් හට විධිමත් රැකවරණයක් නොලැබීම
- දේශීය ශ්‍රම බලකාය අඩුවීම හා පුහුණු ශ්‍රමය හිඟවීම
- බුද්ධි ගලනය (ලකුණු 05)

* * *

The National e-learning Portal for The General Education